යම් කිසි ප්‍රවෘත්තියකට සෘජුවම අදාළ නොවන අවස්ථාවකදී, විශේෂයෙන්ම සෘණාත්මක සන්දර්භයකදී එම පුවතට සම්බන්ධ පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමකගේ වාර්ගිකත්වය හෝ ජාතිය සඳහන් කිරීම ඇතැම් මාධ්‍ය මගින් සිදුකෙරේ. මෙසේ සෘණාත්මක සන්දර්භයන් තුළ සඳහන් වන්නේ බහුතර වාර්ගිකත්වයන් නොව වෙනත් වාර්ගිකත්වයන් වීමද නිරීක්ෂණය කළ හැකි කරුණකි. මෙය ගැටළුවක් ලෙසින් දැකිය යුතු වන්නේ, ඒ ඔස්සේ යම් යම් වාර්ගිකත්වයන් හෝ ජාතීන් සෘණාත්මකව ඒකාකෘතිකගත කිරීම් සිදුවීමේ ඉඩකඩක් පවතින බැවිනි.

පුද්ගලයෙකුගේ වර්ගය, කුලය, ආගම, ලිංගික නැඹුරුතා, ශාරීරික හෝ මානසික වෙනස්කම් පිළිබඳ විස්තර, ප්‍රවෘත්තියට සෘජුවම අදාළ වන්නේ නම් විනා, එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙන් වැළකිය යුත්තේය යනුවෙන් දෙස් විදෙස් මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශනයන්හි දැක්වෙන්නේද ඒ හෙයිනි.

2020 ජනවාරි සිට ජූනි දක්වාත්, 2020 ජූලි සිට දෙසැම්බර් දක්වාත්, 2021 ජනවාරි සිට ජූනි දක්වාත් තෝරාගත් සිංහල භාෂා පුවත්පත් තුළ පුවතට අදාළ නොවන වාර්ගිකත්වය ඉස්මතු කිරීම් සිදුව ඇති ප්‍රමාණය පහත පරිදි වේ.

මූලාශ්‍ර:

https://www.editorscode.org.uk/the_code.php
http://www.slpi.lk/.../uploads/2019/05/Editors-Code-Sin.pdf

**#MediaEthicsSL #lka #sinhalanews #SundayMawbima #Mawbima #Divaina #SundayDivaina #Aruna #SathiagaAruna #Dinamina #Silumina #Lankadeepa #SundayLankadeepa**